# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1825/30 - 2013 අගෝස්තු මස 30 වැනි සිකුරාදා - 2013.08.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය**

සිවිල් ගුවන් සේවා අධිකාරිය

**196 ගුවන් සංතරණ රෙගුලාසි යටතේ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කෙරෙන දැනුම් දීම**

අභ්‍යන්තර පුද්ගලික ගුවන් මෙහෙයුම් (Domestic, Private Charter Air Service Operations) හා කුලී මෙහෙයුම් ගුවන් ප්‍රවාහන සේවාවක් (Charter Operations ) රට තුළ පවත්වාගෙන යාම සඳහා සිවිල් ගුවන් සේවා පනත හා ඊට අදාළ රෙගුලාසි හා කොන්දේසි වලට අනුකූලව ගුවන් මෙහෙයුම් සහතිකය හා කුලී මෙහෙයුම් ගුවන් ප්‍රවාහන බලපත්‍රය ලබා ගැනීම සඳහා රාජගිරිය, බුත්ගමුව පාරේ අංක 100 දරන ස්ථානයේ පිහිටි එෆ්-එයාර්වේස් සමාගම විසින් 2013 ජුනි මස 21 දාතමින් ඉල්ලුම් පත්‍රයක් 2013 ජුනි මස 21 දින මෙම කාර්යාලය වෙත එවනු ලැබ ඇති බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. අයදුම්පතට අනුව සීමාසහිත එෆ්-එයාර්වේස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙසේ ය.

හේමක ද අල්විස් මහතා,
ශිවන්ක ද සොයිසා මහතා,
සමින්ද ජයසේකර මහතා,
නෙලුකා ද අල්විස් මහත්මිය

එකී සමාගමේ යෝජිත ගුවන් මෙහෙයුම් කටයුතු පිළිබඳ පූර්ණ වගකීම කළමණාකාරිත්වය සඳහා කපිතාන් ලූෂාන් ප්‍රනාන්දු මහතා සීමාසහිත එෆ්-එයාර්වේස් සමාගම විසින් නම් කරනු ලැබ ඇත.

අයදුම්කරුගේ සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රයේ පිටපතක් කොළඹ 02, හුණුපිටිය පාර, අංක 04, සිවිල් ගුවන් සේවා අධිකාරියේ බිම් මහලේ පිහිටි තාක්ෂණික පුස්තකාලයේ තබා ඇති අතර ඕනෑම වැඩකරන දිනෙක කාර්යාල වේලාවන් තුල මහජනතාවට පරීක්ෂාකර බැලීමට හැකිය.


1A - G 18187— 160 (2013/08)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යෝජිත මෙහෙයුම් සඳහා අවශ්‍ය ගුවන් මෙහෙයුම් සහතිකය (Air Operator Certificate) හා කුලී මෙහෙයුම් ගුවන් ප්‍රවාහන බලපත්‍රය (Charter License) ඇතුලු අනෙකුත් අදාළ අනුමැතීන් ප්‍රදානය කිරීමට ප්‍රථම, සිවිල් ගුවන් සේවා පනත ගුවන් සංතරණ රෙගුලාසි මෙන්ම අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ නිර්දේශිත ක්‍රියාමාර්ගයන් (International Standard and Recommended Practices) සහ මෙම ආයතනය විසින් පිළිගත් ඒ හා සම්බන්ධිත දේශීය අවශ්‍යතාවයන්ට අනුව නිරුපද්‍රිත වූත් ආරක්ෂිත වූත් කාර්යක්ෂම වූත් ගුවන් ප්‍රවාහන සේවා, මෙහෙයුම් පැවැත්වීම සඳහා අයදුම්කරුවන්ගේ යෝග්‍යතාවය සංස්ථාපිත ක්‍රියාමාර්ගානුකූලව නිසි පරිදි පරීක්ෂාකර බලා මෙම අයදුම්පත සහතික කිරීමේ වැඩ පිළිවෙල 2013 සැප්තැම්බර් මස 20 වැනි දිනට පසුව මවිසින් ආරම්භ කිරීමට තීරණය කර ඇති බව මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඉහත පරිච්ඡේදයේ සඳහන් දිනට අවම වශයෙන් දින 10කට ප්‍රථම ඕනෑම පුද්ගලයෙකු හට ඉහත කී අයදුම්පත සම්බන්ධව ලිඛිතව, නිශ්චිත හේතු පදනම් කර ගත් කරුණු, ගගන නාවික සංතරණ රෙගුලාසි වලට අනුකූලව මා වෙත සංදේශනයන කල හැකිය. අන්තර්ගත සියලු ප්‍රකාශන වල නිරවද්‍යතාවය ලිඛිත සාක්ෂි සමග ඉදිරිපත් කළ යුතු ය. එවැනි සංදේශන මා වෙත ඉදිරිපත් කරන අවස්ථාවේදී ඔහු/ඇය විසින් එහි පිටපතක් අයදුම්කරුට ලැබීමට සැලැස්විය යුතු අතර, එසේ යැවූ බවට සහතිකයක් අදාළ සංදේශයට අමුණා තිබිය යුතු ය.

එච්. එම්. සී. නිමල්සිරි,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ
ප්‍රධාන විධායක නිලධාරී.

2013 අගෝස්තු මස 30 වැනි දින,
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,
අංක 04, හුණුපිටිය පාර,
කොළඹ 02.

09-292

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.